# ජල සම්පත් මණ්ඩලය

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මතය

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජල සම්පත් මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජල සම්පත් මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------------

රු. 6,445,718 ක් වූ ණය ගැතියන් හා රු. 17,218,744 ක් වූ ණය හිමියන්ට අදාලව මණ්ඩලය විසින් සනාථ කිරීම් කැඳවා නොතිබුණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

------------------------------------

ගිණුම් වල දැක්වෙන පහත සඳහන් විෂයයන් එම එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| | ගිණුම් වල විස්තර | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| I. | දේපල, පිරියත හා උපකරණ | 420,802,743 | ස්ථාවර වත්කම් ලේඛනය |
| II. | කෙරීගෙන යන වැඩ | 50,959,293 | |
| III. | හැරූ ළිං පිරිසිදු කිරීම (2009 සහ 2010) | 52,328,000 | ගිවිසුම, විස්තරාත්මක වැඩ සැලැස්ම, ප්‍රගති වාර්තා |
| IV. | නල ළිං ඉදි කිරීම | 3,458,000 | වියදම් විස්තර හා ප්‍රගති වාර්තා |
| V. | ආපදා ණය | 5,496,114 | විස්තරාත්මක උපලේඛන |

1.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

විගණනයේදි පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනත | පාර්තෝෂික ගෙවීම් සඳහා 2010 දෙසැම්බර් 31 දිනට රු. 58,544,345 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණ ද අනාගතයේදි පැන නගින පාර්තෝෂික ගෙවීම් සඳහා සමාන මුදලක් බාහිර වශයෙන් ආයෝජනය කර නොතිබුනී. |
| (ආ) | මුදල් රෙගුලාසි | |
| (i). | මුදල් රෙගුලාසි 104(2) (3) හා 110 | වාහන වලට සිදු වු අනතුරු වලින් වූ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හා අවසාන වාර්තා මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. එසේම අවශ්‍ය පරිදි නැතිවීම් ලේඛනයක් ද පවත්වා නොතිබුණි. |
| (ii.) | මුදල් රෙගුලාසි 272(2) | සියළුම ගෙවීම් වවුචර් ඒවා අදාළ වන මාසයේ අවසානය සිට සති 6 ක් ඉකුත් වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද එම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. |
| (ඇ) | 2008 මැයි 28 දිනැති අංක 428 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය මගින් නිශ්චය කරන ලද සුළු මුදල් ගෙවීමේ සීමාව රු. 1000 ක් වුවද මණ්ඩලය එයට අනුකූල වී නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 | පරිගණක හා උපාංග වල වටිනාකම වශයෙන් රු. 4,327,908 ක් ස්ථාවර වත්කම් යටතේ අවසාන ගිණුම් වල ඇතුලත් කර තිබුණි. එම වත්කම් සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2009 ජුනි 09 දිනැති අංක  ඩීඑම්ඊ/2009(1) දරන  විගණන හා කළමනාකරණ චක්‍රලේඛය | අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර ජනවාරි 31 දිනට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණද, චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව එය පිළියෙල කර නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | 2.2.1 (අ) වගන්තිය | නිශ්චිත කාල රාමුව තුල රාජ්‍ය ව්‍යවසායයන්වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.  කෙසේ වුවද 2008, 2009 හා 2010 වර්ෂ සඳහා එසේ සිදු කර නොතිබුණි. |
| (ii) | 4.2.2 වගන්තිය | තථ්‍ය කාර්ය සාධනය සැලැස්ම සමග එකඟ වී ඇති බවට තහවුරු කර ගැනීම සහ කාලීනව නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට මණ්ඩලය එහි සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය සහ කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද 2010 වර්ෂයට අදාලව එම අවශ්‍යතාවයට අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii.) | 4.2.5 වගන්තිය | මණ්ඩලය එහි කාරක ප්‍රාග්ධනය පිළිබඳ ඵලදායි කළමනාකරණය සහ තොග කාල විශ්ලේෂණ සඳහා පද්ධති ඇති කළ යුතු අතර, යල් පැනගිය, සෙමින් චලනය වන, නරක් වු තොග හා අනෙකුත් විෂයයන් හඳුනා ගැනීමේ ප්‍රකාශනයක් මාසික පදනමින් පිළියෙල කළ යුතුය.  එහෙත් මණ්ඩලය ඒ අනුව එවැනි ප්‍රකාශන පිළියෙල කර සමාලෝචනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 7,134,891 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 302,665 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය රු. 6,832,226 ක වැඩි වීමක් විය.  මූල්‍ය ප්‍රතිඵලය වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුන්  වූයේ වියදම හා ආදායම පිළිවෙලින් රු. 10,006,365 දක්වා  හා රු. 6,174,139 දක්වා  අඩුවීම හා රජයේ ප්‍රදාන රු. 3,000,000 කින් වැඩි වීමයි.

2.2 මෙහෙයුම් සමාලෝචනය.

2.2.1 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

වාර්ෂික ඇස්තමේන්තුවට හා මණ්ඩලයෙන් ලබා ගත හැකි වූ විස්තර වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

(අ) මූල්‍ය කාර්ය සාධනය

| විෂය | ඇස්තමේන්තුගත වටිනාකම රු. | තථ්‍ය රු. | වියදම / ආදායම % |
|---|---|---|---|
| භූගත ජල පර්යේෂණ අධ්‍යයන | 25,100,000 | නැත | 0 |
| භූගත ජල සංවර්ධනය | 12,100,000 | 17,463,509 | 144 |
| පර්යේෂණ, නියාමනය හා පුහුණුව | 5,000,000 | 4,763,746 | 95 |
| ජලය පිළිබඳ විමර්ශන / භූගත ජල ගවේෂණය | 152,470,000 | 41,668,586 | 27 |
| ජල සාම්පල විශ්ලේෂණ | 2,310,000 | 497,325 | 21 |
| ජල බෝතල් කිරීමේ ආදායම | 2,000,000 | නැත | 0 |
| ව්‍යාපෘති අනුමැති හා බලපත්‍ර | 1,000,000 | නැත | 0 |
| ගොවිජන සේවා ආදායම | 1,000,000 | නැත | 0 |
| කාර්ය මණ්ඩල පුහුණු | 500,000 | 218,100 | 43 |
| වෙනත් ආදායම | 745,000 | 2,040,653 | 273 |

(ආ) භෞතික කාර්ය සාධනය

| විෂයය | ඇස්තමේන්තුගත ඒකක | නිමකරන ලද තථ්‍ය ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| නල ළිං හැරීම | 200 | 98 |
| ජල භූ විද්‍යා විමර්ශන | 200 | 148 |
| නල ළිං පිරිසිදු කිරීම | 200 | 50 |
| අත්පොම්ප සවි කිරීම | 125 | 58 |
| සුළං බල පොම්ප කිරීමේ පරීක්ෂණ | 50 | 40 |
| හැරූ ළිං පිරිසිදු කිරීම | 2500 | 1227 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ජලය බෝතල් කිරීම, භූගත ජල පර්යේෂණ අධ්‍යයන, ව්‍යාපෘති අනුමැතිය හා බලපත්‍ර සහ ගොවි ජන සේවා වලින් පිළිවෙලින් රු. 2,000,000 ක් රු. 25,100,000 ක් රු. 1,000,000 ක් හා රු. 1,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද ඉහත ප්‍රභවයන්ගෙන් මණ්ඩලය විසින් කිසිදු ආදායමක් සමාලෝචිත වර්ෂය තුල උපයා ගෙන නොතිබුණි.

(ආ) 2010 ජනවාරි 09 දින විගණනයට ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවට අනුව සමාලෝචිත වර්ෂය තුලදී නල ළිං 200 ක් සහ ජල භූ විද්‍යා විමර්ශන 200 ක් නිම කිරීමට මණ්ඩලය විසින් ඉලක්ක කර තිබුණි. කෙසේ වුවද නල ළිං 98 ක් හා ජල භූ විද්‍යා විමර්ශන 148 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය විසින් නිම කර තිබුණි. මීට අතිරේකව නල ළිං 50 ක් පිරිසිදු කිරීම, අත්පොම්ප 58 ක් සවි කිරීම් , පොම්ප පරීක්ෂණ 40 ක් සහ හැරූ ළිං 1227 ක් පිරිසිදු කිරීම් සමාලෝචිත වර්ෂය තුලදී සිදුකර තිබුණි. මෙම කාර්යයන්හි කාර්ය සාධනය අපේක්ෂිත ඉලක්කයන්ගෙන් 40% සිට 58% ක් දක්වා වූ පරාසයක විය.

(ඇ) මණ්ඩලය විසින් පිළියෙල කරන ලද ආරම්භක ඇස්තමේන්තුවට අනුව යුනිසෙෆ් ආධාර මගින් "උතුරු වසන්තය " වැඩ සටහන යටතේ මුලතිව්, කිලිනොච්චි හා යාපනය දිස්ත්‍රික්ක වල හැරූ ළිං 700 ක් පිරිසිදු කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, හැරූ ළිං 2013 ක් මණ්ඩලය විසින් 2010 මැයි 31 වන විට පිරිසිදු කිරීම් කර තිබුණි. හැරූ ළිං පිරිසිදු කිරීම සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 52.3 ක් වැය කර තිබුණ ද, එයින් රු. මිලියන 42.3 ක මුදලක් ධීවර හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් අයකර ගැනීමට වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අළුත්වැඩියා සිදු කිරීම සඳහා මෝටර් වාහන 10 ක් කම්හල් වලට යවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා සිදුකර නොතිබුණි. ඒවායින් වාහන කිහිපයක් වර්ෂ 4 කට වැඩි කාලයක් අළුතවැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව අංගණයේ ගාල් කර තිබුණි.

(ආ) පෙර වර්ෂයේ ගිණුම් වල දැක්වූ රු. 7,251,998 ක මණ්ඩලයේ හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සමාලෝචිත වර්ෂයේදී ලියා හැර තිබුණි.

(ඇ) ආදායම රැස්කර ගැනීමට අදාළ ලිපිගොනු 19 ක් පිළිබඳ විගණන නියැදි පරීක්ෂණයේදී රු. 5,579,796 ක් වූ මුදලක් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාල පරාසයක සිට හිඟහිට පැවති බව අනාවරණය විය.

2.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

--------------------------------------------

2010 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්ම මණ්ඩලය විසින් පිළියෙල කර තිබුණ ද, මනාව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක කාර්යයන් පදනම් කරගෙන එය සංශෝධනය කර නොතිබුණි.

2.5 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

(අ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක පර්ඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව අවම වශයෙන් සෑම මාස තුනකට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල එක් වරක් පමණක් රැස් වී තිබුණි.

(ආ) මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක 2010 ජුලි 17 දින ඉල්ලා අස් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තනතුර පුරවා නොතිබුණි. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් තම සාමාන්‍ය රාජකාරි වලට අමතරව ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්ය භාරයන් ආවරණය කර තිබුණි. 2010 දෙසැම්බර් 14 දින තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවමින් මණ්ඩලය විසින් දැන්වීමක් පළ කර තිබුණ ද 2011 මාර්තු 31 දක්වා බඳවා ගැනීම සිදු කර නොතිබුණි.

2.6 අක්‍රිය බැංකු ගිණුම්

-----------------------

එකතුව රු. 12,096 ක ශේෂයක් සහිත බැංකු ගිණුම් දෙකක් වර්ෂ ගණනාවක් අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

----------------------

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

(ආ) අයවැය ලේඛනය

(ඇ) ණයගැතියන් හා ණය හිමියන්